සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

60 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :.................................. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I කාලය : පැය 01යි.

වැදගත් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න.

(01) පහත ප්‍රකාශ අතුරින් මිනිස් අවශ්‍යතා සඳහා පමණක් නිදසුන් දැක්වෙන්නේ,
(1) ආහාර, පාසල, නිවාස (2) සෞඛ්‍යය, නිවාස, අන්තර්ජාලය
(3) සන්නිවේදනය, ආහාර, නිවාස (4) ආහාර, නිවාස, නිල ඇඳුම්

(02) පහත A තීරුවෙහි වුවමනා ද, B තීරුවෙහි අවශ්‍යතා දැක්වෙන අතර ඒවා පිළිවෙළින් ගැළපූ විට නිවැරැදි පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| (i) CCTV කැමරා | A. සෞඛ්‍යය |
| (ii) සුවසැරිය ගිලන්රථය | B. ආරක්ෂාව |
| (iii) පොත්පත් | C. සන්නිවේදනය |
| (iv) ජංගම දුරකථන | D. අධ්‍යාපනය |

(1) A B C D (2) B A D C (3) C A B D (4) B A C D

(03) වෛද්‍යවරයාගේ සේවය .........A.......... වන අතර වෙද නළාව .........B......... .
ඉහත ප්‍රකාශයේ A හා B ස්ථානවලට අදාළ නිවැරැදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සේවාවක්, භාණ්ඩයකි. (2) අවශ්‍යතාවක්, වුවමනාවකි.
(3) භාණ්ඩයක්, සේවාවකි. (4) වුවමනාවක්, භාණ්ඩයකි.

(04) පහත ව්‍යාපාර අතුරින් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර ආයතනයකට අයත් වනුයේ,
(1) රක්ෂණ ආයතන (2) සිල්ලර වෙළෙඳ ආයතන
(3) රූපලාවන්‍ය ආයතන (4) පුටු නිෂ්පාදන ආයතන

(05) භූමිය නැමැති නිෂ්පාදන සාධකයට නිදසුන් දැක්වෙන පිළිතුර වනුයේ,
(1) වන සම්පත්, පස (2) වන සම්පත්, ඔප දැමූ මැණික්
(3) පස, ගොඩනැගිලි (4) ඛනිජ සම්පත්, මුදල්

(06) පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) භාණ්ඩ හා සේවා නිපදවීමේ හා සැපයීමේ නිරත ආයතන ව්‍යාපාර නම් වේ.
(2) සෑම ව්‍යාපාරයක ම ප්‍රධාන අරමුණ ලාභ ඉපැයීම වේ.
(3) අවශ්‍යතා සපුරා ගන්නා ආකාර වුවමනා නම් වේ.
(4) අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමට යොදා ගන්නා භෞතික පැවැත්මක් ඇති දෑ භාණ්ඩ නම් වේ.

(07) විවිධ පාර්ශවවල අපේක්ෂිත දායකත්වයන් අතර ව්‍යාපාර සඳහා හිතකර විවිධ දිරිගැන්වීම් ලබාදීම අපේක්ෂා කරන්නේ,
(1) කළමනාකරුවන්ගෙන් (2) සැපයුම්කරුවන්ගෙන්
(3) රජයෙන් (4) ප්‍රජාවගෙන්

(08) "ව්‍යාපාරයක .........1.......... යෙදූ මුදලේ සුරක්ෂිතතාව පිළිබඳ උනන්දුවක් දක්වන අතර .........2......... සාධාරණ වැටුප් ලබාගැනීමට උනන්දුවක් දක්වති."

ඉහත ප්‍රකාශයේ 1 හා 2 යන ස්ථානවලට අදාළ නිවැරැදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) තරඟකරුවෝ, සේවකයෝ (2) සැපයුම්කරුවෝ, සේවකයෝ

(3) අයිතිකරුවෝ, සැපයුම්කරුවෝ (4) අයිතිකරුවෝ, සේවකයෝ

- **පහත සිද්ධිය ඇසුරින් (09), (10), (11) යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

"අමාධි තත්සරී විසින් "අමා බුක් ෂොප්" නමින් ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පාසල අසල පවත්වාගෙන යයි. මෙහි කළමනාකරුවෙක් හා සේවකයන් දෙදෙනෙකු සේවය කරයි." අමාධි විසින් ප්‍රදේශයේ වානිජ බැංකුවකින් ව්‍යාපාරික ණයක් ද ඉල්ලුම් කර ඇත.

(09) "අමා බුක් ෂොප්" හි ඇල්මැති පාර්ශවයක් වන අමාධිගේ අරමුණක් නොවන්නේ,

(1) ප්‍රමාණවත් ලාභ ලැබීම. (2) තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම.

(3) ව්‍යාපාරයේ අනාගත වර්ධනය (4) ආයෝජනයේ සුරක්ෂිතතාව

(10) "අමා බුක් ෂොප්" වෙත සිය නිෂ්පාදන ලබා දෙන "රිචඩ් සමූහ ව්‍යාපාරයේ" අරමුණක් වන්නේ,

(1) තම නිෂ්පාදිතවල මිල තීරණය කිරීම. (2) නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනීම.

(3) නිසි පරිදි මුදල් ලබා ගැනීම. (4) දෙන ලද ණය අයකර ගැනීම.

(11) "අමා බුක් ෂොප්" හි ඇල්මැති පාර්ශවයක් නොවන්නේ,

(1) අමාධි (2) "ශෙහානි" බුක්ෂොප්

(3) මහජන බැංකුව (4) සහන් කිරිහල

(12) පහත X තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවය ද, Y තීරුවේ ඔවුන්ගේ අපේක්ෂිත දායකත්වය ද දක්වා ඇත.

| X තීරුව | Y තීරුව |
|---|---|
| (i) අයිතිකරුවන් | A. කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම. |
| (ii) කළමනාකරුවන් | B. ශ්‍රම ඵලදායිතාව වැඩි කිරීම. |
| (iii) සේවකයන් | C. ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුව හා කැපවීම |
| (iv) සැපයුම්කරුවන් | D. නිවැරැදි තීරණ ගැනීම |

ඉහත X තීරුව හා Y තීරුව අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන නිවැරැදි පිළිතුර වන්නේ,

(1) C D B A (2) D C B A (3) C B D A (4) C D A B

(13) "පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය" පිහිටවනු ලැබූ පනත නිවැරැදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත

(2) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනත

(3) 2003 අංක 09 දරන පාරිභෝගිකයන් පිළිබඳ අධිකාරි පනත

(4) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනත

(14) ව්‍යාපාර පරිසරය පිළිබඳ සිදුවීම් කිහිපයක් පහත වේ.

(A) විදේශීය ලොකු ඇණු සඳහා වන නව බදු සංශෝධන පිළිබඳ මෙවර අයවැය යෝජනාවලියේ සඳහන් වේ.

(B) බැංකු තැන්පතු පොළී අනුපාතිකය 2% න් ඉහළ යාම.

(C) පරිසර ආරක්ෂණය සඳහා ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීම් ඇලවීම තහනම් කරමින් නව පනතක් සම්මත වී ඇත.

ඉහත සිදුවීම් අතුරින් දේශපාලන පරිසරයට අදාළ සිදුවීම් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1) A හා B (2) A පමණි (3) A හා C (4) C පමණි.

(15) පහත ප්‍රකාශයන් අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) තම දක්ෂතාව හැකියාව ප්‍රයෝජනයට ගනිමින් පවරන ලද කාර්යය නිසි ලෙස ඉටු කරන පුද්ගලයෝ කළමනාකරුවෝ වෙති.

(2) ජාත්‍යන්තර සබඳතා, වෙළෙඳ ගිවිසුම් යනු දේශපාලන පරිසරයට අයත් සාධකයකි.

(3) අයවැය ප්‍රතිපත්ති ආර්ථික පරිසරයට අයත් සාධකයකි.

(4) රජය විසින් පනවන අණපනත් හා නීතිරීති නෛතික පරිසරය යටතේ සාකච්ඡා කෙරේ.

(16) ව්‍යාපාරයකට පාලනය කිරීමට හැකි පරිසරය වනුයේ,

(1) අභ්‍යන්තර පරිසරය (2) තාක්ෂණික පරිසරය

(3) ප්‍රජා පරිසරය (4) බාහිර පරිසරය

(17) පහත දක්වා ඇති කරුණු අතරින් "යටිතල පහසුකම් සැපයීම" යටතට අයත් නොවන සිදුවීම කවරක් ද?

(1) මධ්‍යම අධිවේගී මාර්ගයේ නව පිවිසුම් මාර්ගයකට මුල් ගල තිබීම.

(2) රජරට දුෂ්කර ප්‍රදේශ සඳහා නව ජල යෝජනා ක්‍රමයක් ඇරඹීම.

(3) බේරේ වැවේ ඇල මාර්ග හරහා මගී ප්‍රවාහන බෝට්ටු ක්‍රමයක් හඳුන්වා දීම.

(4) තැපැල් සේවයේ ටෙලිග්‍රෑම් සේවය වෙනුවට ටෙලිමේල් (Telemail) භාවිතය ඇරඹීම.

(18) පහත දැක්වෙන්නේ පරිසර සාධක කිහිපයකි. ඉන් බාහිර පරිසරයට අයත් සාධකයක් වන්නේ,

(1) කළමනාකරුවන් (2) අයිතිකරුවන්

(3) තාක්ෂණය (4) සේවකයින්

(19) ශ්‍රී ලංකා මහ බැංකු නියමයන් මත මහ බැංකුව විසින් තැන්පතු පොළී අනුපාතය ඉහළ දමන ලදී. මෙය,

(1) තාක්ෂණික පරිසරයට අයත් වේ. (2) ආර්ථික පරිසරයට අයත් වේ.

(3) නෛතික පරිසරයට අයත් වේ. (4) දේශපාලන පරිසරයට අයත් වේ.

(20) තාක්ෂණික පරිසරයට අයත් නොවන නිදසුනක් ලෙස,

(1) සරල අත් යන්ත්‍ර වෙනුවට නවීන යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම.

(2) සාමාන්‍ය තැපෑල වෙනුවට විද්‍යුත් තැපෑල භාවිත කිරීම.

(3) පොත්වල තැබූ ගිණුම් සටහන් සඳහා පරිගණක තොරතුරු පද්ධති යොදා ගැනීම.

(4) රජය විසින් සාමාන්‍ය මහා මාර්ග වෙනුවට අධිවේගී මහා මාර්ග ඉදි කිරීම.

(21) තාක්ෂණික පරිසරය ලෙස හඳුන්වන්නේ,

(1) නව තාක්ෂණික උපකරණ භාවිතය (2) නව යන්ත්‍ර සූත්‍ර භාවිතය

(3) නව ක්‍රමවේද හා නව සොයාගැනීම් (4) ඉහත සියල්ලම

(22) ආදායම් ව්‍යාප්තිය ආර්ථික පරිසරයට අයත් සාධකයක් ලෙස හැඳින්විය හැක. ඒ අනුව ආදායම් ව්‍යාප්තිය ලෙස හඳුන්වන්නේ,

(1) රටක ජාතික ආදායම ජනතාව අතර බෙදී ඇති ආකාරය

(2) ආදායම බෙදී යාමේ විෂමතාවය

(3) එක් එක් පුද්ගලයා ආදායම උපයා ගන්නා ආකාරය

(4) පුද්ගල ආදායම ව්‍යාප්ත වී ඇති ආකාරය

(23) ගෝලීයකරණය නිසා ලෝකයේ රටවල් අතර ව්‍යාපාර කටයුතු නිදහසේ කිරීමට හැකියාව ලැබී ඇත. ගෝලීයකරණය යනු,
   (1) දේශ සීමා හා වෙනත් බාධක ඉවත් වීම.
   (2) සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුව
   (3) රටවල් අතර ආර්ථික, සමාජීය හා සංස්කෘතික බැඳීම.
   (4) ලෝකය ගෝලාකාරව පිහිටීම.

(24) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයේ හිතකර බලපෑමක් ලෙස,
   (1) දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදී යාම.
   (2) දැඩි තරඟකාරිත්වයට මුහුණ දීම.
   (3) විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.
   (4) දේශීය සංස්කෘතික බලපෑම්

(25) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදු වන අහිතකර බලපෑමක් ලෙස,
   (1) දේශීය ව්‍යාපාරවල පැවැත්ම අස්ථාවර වීම.
   (2) දේශීය භාණ්ඩ හා සේවා සඳහා විදේශ වෙළෙඳපොළ ලබා ගත හැකි වීම.
   (3) කාර්යක්‍ෂම යන්ත්‍ර සූත්‍ර ලබා ගත හැකි වීම.
   (4) ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම.

(26) පහත ප්‍රකාශවනවලින් සත්‍ය ප්‍රකාශ ලෙස යොදා ගත හැක්කේ,
   A. විදේශ තාක්ෂණය නිසා භාණ්ඩ වෙළෙඳපොළට පැමිණීම නිසා දේශීය ව්‍යාපාර දියුණු වේ.
   B. ගෝලීයකරණය නිසා ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වේ.
   C. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණයේ වෙනස්වීම සෑම විටම ව්‍යාපාරවලට හිතකර වේ.
   D. ගෝලීයකරණය මඟින් මිනිසුන් අතර පැවැති දුරස්ථභාවය වැඩි වී ඇත.

   (1) B හා C පමණි.   (2) A හා B පමණි.   (3) A හා D පමණි.   (4) C හා D පමණි.

(27) ජයසිංහ මහතා ප්‍රදේශයේ වී මිලදී ගෙන සහල් බවට පත් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඒ සඳහා ඔහුගේ මිතුරෙකු වූ කුලසිංහ මහතා සේවකයෙකු ලෙස ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. ජයසිංහ මහතා එම ව්‍යාපාරය "සිංහ මිල්ස්" ලෙස නම් කරන ලදී.
"සිංහ මිල්ස්" ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?
   (1) ඒක පුද්ගල ව්‍යාපාර   (2) හවුල් ව්‍යාපර
   (3) සංස්ථාපිත සමාගම්   (4) සමූපකාර සමිති

(28) ඉහත ව්‍යාපාරය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරින් නිවැරැදි ප්‍රකාශය කුමක් ද?
   (1) රජය විසින් පාලනය කරනු ලබයි.   (2) අඛණ්ඩ පැවැත්මක් ඇත.
   (3) ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.   (4) නෛතික පුද්ගලභාවයක් ඇත.

(29) ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායකයක් නොවන්නේ,
   (1) හිමිකාරත්වය අනුව   (2) නෛතික පුද්ගලභාවය අනුව
   (3) අරමුණ අනුව   (4) පරිමාණය අනුව

(30) නෛතික පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධානයක් වන්නේ,
   (1) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව   (2) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
   (3) ශ්‍රී ලංකා වරාය අධිකාරිය   (4) විදේශ සේවා නියුක්ති කාර්යාංශය

(31) ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියක් වන්නේ,
   (1) ආරම්භ කිරීම පහසු වීම.   (2) වැඩි ප්‍රාග්ධනයක් එක් රැස් කර ගත හැකිවීම.
   (3) සාමූහික තීරණ ලබා ගත හැකි වීම.   (4) නෛතික පුද්ගලභාවයක් ලැබීම.

(32) රාජ්‍ය සංස්ථා සම්බන්ධ නිවැරැදි ප්‍රකාශය තෝරන්න.

(1) සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීම.
(2) නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
(3) ස්වාධීන තීරණ ක්‍රියාත්මක කළ හැකි වීම.
(4) පාර්ලිමේන්තු පනතක් අනුව පිහිටුවීම.

(33) ලාභ ලැබීම අරමුණු කරගත් ව්‍යාපාර සංවිධානයකි.

(1) සමූපකාර සමිති (2) රාජ්‍ය දෙපාර්තමේන්තු
(3) රාජ්‍ය සමාගම් (4) ක්‍රීඩා සමිති

(34) සංස්ථාපිත සමාගමකට නිදසුනකි.

(1) සමිත පෙරේරා ව්‍යාපාරය (2) සිල්වා සහ සමාගම
(3) සී/ස රන්දුනු (පෞද්) සමාගම (4) ලංකා විදුලිබල මණ්ඩලය

(35) ව්‍යවසායකයන් වැඩි වශයෙන් සුළු පරිමාණ ව්‍යාපාර තෝරා ගැනීමට හේතුවක් ලෙස සැලකිය නොහැක්කේ,

(1) සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි වීම.
(2) අවම නීතිමය බලපෑම් යටතේ ආරම්භ කළ හැකි වීම.
(3) අදාළ කර්මාන්තය තුළ විශාල බලපෑමක් කළ හැකි වීම.
(4) තම දක්ෂතා උපරිම ලෙස ප්‍රයෝජනයට ගත හැකි වීම.

(36) සමූපකාර සමිතිවල දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම. (2) සාමාජිකයන්ගේ සාමූහික අයිතිය
(3) පෞද්ගලික අරමුණුවලින් යුක්ත වීම. (4) ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය

(37) දිල්කි ව්‍යාපාරය උපරිම ලාභය ලැබීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයකි. ඒ අනුව ලාභ ලැබීමේ අරමුණකින් තොරව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සංවිධානයක් වන්නේ,

(1) සංස්ථාපිත සමාගම් (2) හවුල් ව්‍යාපාර
(3) රාජ්‍ය සමාගම් (4) සමූපකාර සමිති

(38) ධනුක ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී සළකා බැලිය යුතු සාධක පිළිබඳ විමසමින් සිටියි. එහි දී ඔහුට ව්‍යාපාරයක පරිමාණය තීරණය කිරීමේ සාධක අතර ප්‍රධානතම සාධක ඇතුළත් කාණ්ඩය වනුයේ,

(1) අයිතිකරුගේ මූල්‍ය ශක්තිය, කුසලතා, විවිධ සබඳතා, පළපුරුද්ද
(2) අයිතිකරුගේ මූල්‍ය ශක්තිය, සේවක ප්‍රමාණය, නිපදවන භාණ්ඩ, විවිධ සබඳතා
(3) නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, වෙළෙඳපොළ කොටස, කුසලතා, පළපුරුද්ද
(4) නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, අයිතිකරුගේ මූල්‍ය ශක්තිය, වෙළඳපොළ කොටස, කුසලතා

(39) දෙනුෂිගේ ව්‍යාපාරය "දෙනුෂි ටෙක්ස්ටයිල්" නමින් පවත්වාගෙන යාමට අදහස් කළ ද, එහි දී ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අදාළ ගාස්තු නියම කිරීමට බලය පැවරී ඇත්තේ කාටදැයි විමසමින් සිටී. ඒ අනුව ඇයට දිය හැකි නිවැරැදි පිළිතුර වන්නේ,

(1) අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේකම්තුමාට ය.
(2) අදාළ ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී තුමාට ය.
(3) ඒ ඒ පළාත් සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව ය.
(4) අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයාට ය.

(40) සුපුන්ගේ ව්‍යාපාරය "සුපුන් ස්ටෝර්ස්" නමින් ලියාපදිංචි කර පවත්වා ගෙන යයි. එම ව්‍යාපාරයට ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජනයක් **නොවන්නේ,**

(1) ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් ලැබීම ය.
(2) ව්‍යාපාරනාමයේ අයිතිය තහවුරු වීම ය.
(3) රජයෙන් ලබා දෙන දිරිගැන්වීම් ලබාගැනීමට සුදුසුකමක් වීම ය.
(4) ණය ලබා ගැනීමේ දී පහසුකමක් ලැබීම ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

60 | S | II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

**නම/විභාග අංකය :................................ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය-II කාලය : පැය 02යි.**

වැදගත් :

- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

(01) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තරුෂ අ.පො.ස (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිට විශ්වවිද්‍යාල වරම් නොලැබූ අයෙකි. ඔහු එම විෂය ධාරාව හැදෑරීම තුළින් ලත් දැනුම පදනම් කරගෙන "දිදුල LED" බල්බ විවිධ මාදිලියෙන් හා විදුලිය තවදුරටත් අඩුවෙන් වැයවන ආකාරයට නිෂ්පාදනය කිරීම ආරම්භ කළේය. ඒ සඳහා ඔහු තම පියා විසින් ආපසු නොගැනීමේ පදනම මත ලබාදුන් රුපියල් ලක්ෂයක මුදල හා වාණිජ බැංකු මඟින් සුළුපරිමාණ ව්‍යාපාරිකයින් දිරිමත් කිරීමේ අරමුණින් ලබාදෙන රුපියල් ලක්ෂයක බැංකුණය ද ව්‍යාපාරයට යෙදවීය. තව ද නිෂ්පාදන කටයුතු සඳහා ඔහු පදිංචි නිවස අයත් ඉඩමේ භාවිතයට නොගන්නා ගොඩනැගිල්ලක් යොදා ගන්නා ලදි. LED බල්බ අලෙවිය සඳහා තම පියාගේ කුඩා ලොරිය කුලී පදනමකින් තොරව භාවිතා කරයි.

(1) (i) තරුෂගේ ව්‍යාපාරයේ ප්‍රධානතම අරමුණ කුමක් ද?
(ii) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව තරුෂගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයට අයත් වේ ද?

(2) සිද්ධිය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| භාණ්ඩ වර්ගය | සන්නම් නාමය | තෝරා ගැනීමට හේතු |
|---|---|---|
| විදුලි බල්බ | (i) .......................................... | (ii) .......................................... |

(3) සිද්ධියේ සඳහන් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය ලෙස හඳුනාගත හැකි දෑ දෙකක් සඳහන් කරන්න.

(4) තරුෂගේ ව්‍යාපාරය කෙරෙහි රජය විසින් දක්වන දායකත්වය කුමක් ද?

(5) LED බල්බ නව මාදිලිවලින් ඉදිරිපත් කිරීම අයත්වන පරිසරය කුමක් ද?

(6) (i) ඉහත සිද්ධිය ඇසුරින් ශක්තීන් හා අවස්ථා සඳහා නිදසුන බැගින් ලියන්න.
(ii) ඒවා කුමන පරිසර වර්ගවලට අයත් වේ ද?

(7) (i) තරුෂගේ ව්‍යාපාරය අරමුණ අනුව කුමන ව්‍යාපාර සංවිධානයට අයත් වේ ද?
(ii) එම ව්‍යාපාරය පරිමාණය අනුව කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?

(8) (i) තරුෂගේ ව්‍යාපාරයට ගනුදෙනුකරුවන්ගේ සිත් ඇදගන්නා නමක් යෙදීමට අදහස් කරයි. ඒ සඳහා සුදුසු ව්‍යාපාර නාමයක් ලියා දක්වන්න.
(ii) එම ව්‍යාපාර නාමය ලියාපදිංචි කරන්නේ නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ඉල්ලුම් පත්‍ර දෙක මොනවා ද?

(9) (8) වන ප්‍රශ්නයේ (i) කොටසේ සඳහන් ව්‍යාපාර නාමය ලියාපදංචි කළේ නම් එම ව්‍යාපාරයට අත්පත් කරගත හැකි වාසි දෙකක් ලියන්න.

(10) තරුෂගේ ව්‍යාපාරය දියුණු කරගැනීම සඳහා ණය පහසුකම් ලබාගත හැකි ආයතන දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (1) ව්‍යාපාරයක දැකිය හැකි ප්‍රධාන අරමුණු දෙක නම් කරන්න.

(2) මෙවර නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ 100m දුර දිවීමේ ඉසව්ව සඳහා පියුමි හංසිකා සහභාගි වෙමින් සිටිය දී ක්ලාන්ත වී ඇද වැටුනා ය. නිවාස භාර ගුරුතුමිය වහා ම ඇයට ප්‍රථමාධාර දීමට කටයුතු කළාය. ඉහත සිද්ධියේ සඳහන් අවශ්‍යතාවක් හා වුවමනාවක් ලියන්න.

(3) අවශ්‍යතා හා වුවමනා අතර දක්නට ලැබෙන වෙනස්කම් දෙකක් ලියන්න.

(4) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) නිෂ්පාදනයේ දී ආධාර කරගන්නා මිනිසා විසින් සකස් කර ගන්නා දෑ ප්‍රාග්ධනය නම් වේ.

(ආ)ගණකාධිකාරීවරු වැනි මනස වෙහෙසා වැඩ කරන පුද්ගලයෝ ශ්‍රමය යන නිෂ්පාදන සාධකයට අයත් වේ.

(ඉ) ව්‍යාපාරකට සම්පත් සපයන පුද්ගලයෝ එහි අයිතිකරුවෝ ය.

(ඊ) භාණ්ඩයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ දී පාරිභෝගිකයන්ගේ රුචිකත්වය සලකා බැලීම අවශ්‍ය නොවේ.

(5) තරිඳු සහ සුපුන් පාසලක් ඉදිරිපිට TS Book Shop නමින් ලිපිද්‍රව්‍ය වෙළඳසලක් පවත්වාගෙන යති. TS Book Shop හි ඇල්මැති පාර්ශව දෙකක් ලියන්න. (ල 2 x 10 = 10)

(03) (1) (අ) රජය ව්‍යාපාර කෙරෙහි පනවන නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා ඇතිකර තිබෙන රාජ්‍ය ආයතන 02ක් ලියන්න. (ලකුණු 01)

(ආ) අභ්‍යන්තර පරිසර සාධකයක් වන කළමනාකරුවෝ යන්න හඳුන්වන්න. (ලකුණු 01)

(2) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න. (ලකුණු 02)

(අ) ව්‍යාපාරක අයිතිකරුවන් අභ්‍යන්තර පරිසර සාධකයක් වන අතර ණයදෙනුකරුවන් බාහිර පරිසර සාධකයක් වේ. ( )

(ආ) ආදායම් ව්‍යාප්තිය දේශපාලන පරිසරයට අයත් සාධකයක් වේ. ( )

(ඉ) ව්‍යාපාර කටයුතු මෙහෙයවීමට අදාළ තීරණ ගනු ලබන්නේ අයිතිකරුවන් විසිනි. ( )

(ඊ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යනු රජයේ අණපනත් හා නීතිරීති යටතේ ක්‍රියාකරන රාජ්‍ය නිලධාරියෙකි. ( )

(3) සමෝද් තමා ජීවත්වන හික්කඩුව ප්‍රදේශයේ සිප්පිකටු ආදී ස්වාභාවික අමුද්‍රව්‍ය යොදා නිපදවූ නිෂ්පාදිත සංචාරකයන්ට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. එහි මුදල් අයකැමි ලෙස රුචිනි සේවය කරනු ලබයි.

(අ) ඉහත ඡේදයේ දැක්වෙන ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් සාධක 02ක් දක්වන්න. (ලකුණු 01)

(ආ) සමොද්ගේ වෙළඳසැලට සිප්පිකටු ආශ්‍රිත නිෂ්පාදිත සපයනු ලබන අභිෂේක් අයත් වන ව්‍යාපාර පරිසරය කුමක් ද? (ලකුණු 01)

(4) තාක්ෂණික වෙනස්වීම් නිසා ව්‍යාපාරවල සිදුවූ වෙනස්කම් 02 ක් ලියන්න. (ලකුණු 02 )

(5) ආර්ථික පරිසරයේ සාධක දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 )

(04) (1) (අ) කේවල ස්වාමි ව්‍යාපාර යන්න හඳුන්වන්න.

(ආ) එවැනි ව්‍යාපාර සංවිධානයක අවාසියක් ලියන්න. (ලකුණු 02)

(2) පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද, අසත්‍යය ද යන්න දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්යය නොවේ. ( )


(ආ) හවුල් ව්‍යාපාරවල අවම සාමාජික සංඛ්‍යාව 02 ක් වන අතර උපරිමය සීමාවක් නොමැත. ( )

(ඉ) සංස්ථාපිත සමාගම් සඳහා බලපාන පනතක් ලෙස 2007 අංක 17 දරණ පනත දැක්විය හැක. ( )

(ඊ) රාජ්‍ය සංස්ථාවල ලියාපදිංචිය අනිවාර්ය වේ. ( )

(ලකුණු 02)

(3) හිමිකාරිත්වය යටතේ ව්‍යාපාර සංවිධාන වර්ග වී ඇති ආකාරය පහත දැක්වේ. එය අධ්‍යයනය කර හිස්තැන් පුරවන්න.




(ලකුණු 02)

(4) හවුල් ගිවිසුම හා හවුල් ඔප්පුව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

(5) අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව සමුපකාර සංවිධාන ක්‍රමයේ පවතින වාසි 02 ක් ලියන්න. (ලකුණු 02)

(05) "ව්‍යාපාර ක්ෂේත්‍රය පුළුල් වීමත් සමඟ ව්‍යවසායකයින් යෝග්‍ය ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී විවිධ නිර්නායක සොයා බලයි."

(1) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනිමේ දී හඳුනා ගත හැකි වර්ග දෙක කුමක් ද? (ලකුණු 1 x 2 = 2)

(2) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

(අ) සමාජ සුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේ රජය මඟින් පමණි.

(ආ) රාජ්‍ය දෙපාර්තමේන්තු ලාභය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයකි.

(ඉ) ව්‍යාපාරිකයින්ගේ අරමුණ කුමක් වුවත් ඔවුන් පෞද්ගලික අංශයේ ව්‍යාපාර තෝරා ගත යුතුය.

(ඊ) සංස්ථාපිත සමාගමක් කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස් කරයි. (ලකුණු 1/2 x 4 = 2)

(3) (අ) සුළු, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී සලකා බලනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 1/2 x 2 = 1)

(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ දින කීයක් ඇතුළත ද? (ලකුණු 1/2 x 2 = 1)

(4) D.A. පෙරේරා විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරය එම නමින් ම පවත්වා ගෙන යනු ලබයි.

(අ) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය්‍ය ද? නැද් ද? යන්න දක්වන්න. (ලකුණු 01)

(ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 01)

(5) පුද්ගලයින් කිහිප දෙනෙකු මඟින් ව්‍යාපාර කළමනාකරණ කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන්නේ නම් තෝරා ගතයුතු ව්‍යාපාර සංවිධාන වර්ග 02 ක් දක්වන්න. (ලකුණු 1 x 2 = 2)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

60 | S | I,II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (3) | 11. | (4) | 21. | (4) | 31. | (1) |
| 02. | (2) | 12. | (1) | 22. | (1) | 32. | (4) |
| 03. | (1) | 13. | (1) | 23. | (3) | 33. | (3) |
| 04. | (4) | 14. | (2) | 24. | (3) | 34. | (4) |
| 05. | (1) | 15. | (4) | 25. | (1) | 35. | (3) |
| 06. | (2) | 16. | (1) | 26. | (2) | 36. | (3) |
| 07. | (3) | 17. | (4) | 27. | (1) | 37. | (4) |
| 08. | (4) | 18. | (3) | 28. | (3) | 38. | (1) |
| 09. | (2) | 19. | (2) | 29. | (2) | 39. | (3) |
| 10. | (3) | 20. | (4) | 30. | (2) | 40. | (1) |

## II පත්‍රය

(01) (1) (i) ලාභ ලැබීමේ අරමුණ
(ii) නිෂ්පාදන ව්‍යාපාරයක්

(2) (i) දිදුල බල්බ්
(ii) විදුලිය අඩුවෙන් වැයවන නිසා

(3) මුදල් , ගොඩනැගිල්ල, ලොරි රථය

(4) ව්‍යාපාරය සඳහා හිතකර දිරිගැන්වීම් ලබා දීම.

(5) තාක්ෂණික පරිසරය

(6) (i) ශක්තියක් : LED බල්බ නිපදවීමට ඇති දැනුම, මූල්‍ය ශක්තිය .........
අවස්ථාව : රජයේ අනුග්‍රහය, වාණිජ බැංකු මගින් ලබාදෙන ණය මුදල
(ii) ශක්තීන් - අභ්‍යන්තර පරිසරය
අවස්ථා - බාහිර පරිසරය

(7) (i) ලාභ ලැබීමේ අරමුණ අනුව පෞද්ගලික අංශයේ ඒක පුද්ගල
(ii) සුළු පරිමාණ ව්‍යාපාර

(8) (ii) අයිතිකරුවන්ගේ සම්පූර්ණ නමින් හැර දී ඇති ඕනෑම ආකර්ෂණීය ව්‍යාපාර නාමයකට
(ii) ❋ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය
❋ ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

(9) ❋ අනන්‍යතාවක් ලැබීම, ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම. ......... ආදී වශයෙන්

(10) වාණිජ බැංකු, සමූපකාර ණය දෙන සමිති, ග්‍රාමීය බැංකු

(ලකුණු 2 x 10 = 20)

(02) (1) - ලාභ ඉපැයීම
- පාරිභෝගික තෘප්තිය ඉහල නැංවීම.

(2) සෞඛ්‍ය - අවශ්‍යතාව
ප්‍රථමාධාර - වුවමනාව

(3)

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| - අත්‍යවශ්‍ය වේ. | - අත්‍යවශ්‍ය නොවේ |
| - පොදුවේ. | - විවිධ වේ. |
| - නිර්මාණය කළ නො හැකි වේ | - නිර්මාණය කළ හැකි වීම. |
| - සිමිත වේ. | - අසීමිත වේ. |
| - සරලවේ. | - සංකීර්ණ වේ. |

(4) (අ) සත්‍යයි (ආ) සත්‍යයි
(ඉ) සත්‍යයි (ඊ) අසත්‍යයි

(5) පාසල් ශිෂ්‍යයින්
තරිඳු හා සුපුන්
අයිතිකරුවන්/ හවුල්කරුවන් (ලකුණු 2 x 5 = 10)

(03) (1) (අ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.
මධ්‍යම පරිසර අධිකාරිය.
කම්කරු විනිශ්චය සභා.

(ආ) ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාරය සතු සම්පත් මෙහෙයවීමට අවශ්‍ය තීරණ ගන්නා පුද්ගලයෝ කළමනාකරුවෝ වෙති.

(2) (අ) සත්‍යය (ආ) අසත්‍යය
(ඉ) අසත්‍යය (ඊ) සත්‍යය

(3) (අ) අයිතිකරු - සමෝද්
සේවකයා - රුවිනි
ආ) බාහිර පරිසරය

(4) අතීතයේ භාවිත කළ සාමාන්‍ය තැපැල වෙනුවට විද්‍යුත් තැපැල (e-mail) භාවිත කිරීම.
අතීතයේ රෙදි විවීමට භාවිත කළ සරල අත්යන්ත්‍ර වෙනුවට නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය.
තොරතුරු තාක්ෂණයේ දියුණුව
(ආදී නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

(5) පොලී අනුපාතය, උද්ධමනය, ආදායම් ව්‍යාප්තිය, රැකියා නියුක්තිය, ජාත්‍යන්තර සබඳතා, විදේශ විනිමය අනුපාත, ඉතුරුම් → (නිවැරදි විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න..)
(සාධක නම් කිරීමට - ලකුණු 01)
(විස්තර කිරීමට - ලකුණු 01)

(04) (1) (අ) ව්‍යාපාර අයිතිය තනි පුද්ගලයෙකු සතුවන ව්‍යාපාර
(ආ) 1. වගකීම අසීමිත වීම.
2. නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
3. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
(ගැලපෙන පිළිතුරු දෙකකට ලකුණු 02)

(2) (අ) සත්‍යයි (ආ) අසත්‍යයි
(ඉ) අසත්‍යයි (ඊ) සත්‍යයි. (ලකුණු 02)

(3) (අ) පෞද්ගලික අංශය
(ආ) රාජ්‍ය සමාගම (ලකුණු 02)

(4) හවුල්කරුවන් අතර ඇති කර ගන්නා එකඟතාවය හවුල් ගිවිසුම ලෙස හඳුන්වන අතර එම එකඟතාවය ලිඛිතව ගිවිසුමක් යටතේ පවත්වා ගැනීම හවුල් ඔප්පුව වේ.
(ලකුණු 02)

(5) 1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම.
2. සාමාජික සුභ සාධනය වෙනුවෙන් කටයුතු කිරීම.
3. රාජ්‍ය අනුග්‍රහ ලැබීම.
4. ආර්ථික ප්‍රතිලාභ බෙදීයාම. (ලකුණු 02)

(05) (1) සුළු පරිමාණ ව්‍යාපාර
මහා පරිමාණ ව්‍යාපාර (ලකුණු 02)

(2) (අ) අසත්‍යයි (ආ) අසත්‍යයි
(ඉ) සත්‍යයි (ඊ) සත්‍යයි
(ලකුණු 1/2 x 4 = 02)

(3) (අ) - ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය
- සේවක සංඛ්‍යාව
- භාවිත කරන බලශක්ති ප්‍රමාණය
- ව්‍යාපාරයට ඇති වෙළඳ පොල කොටස
(ලකුණු 1/2 x 2 = 1)
(ආ) දින 14 ක් ඇතුළතය.

(4) (අ) අනිවාර්යය නැත. (ලකුණු 01)
(ආ) ව්‍යාපාරය ඔහුගේ සම්පූර්ණ නමින් පවත්වාගෙන යනු ලබන නිසා (ලකුණු 01)

(5) හවුල් ව්‍යාපාර
සංස්ථාපිත සමාගම් (ලකුණු 1 x 2 = 2)